# නිල් මැණිකේ අභිරහස



පිනිති වීරසේකර

# නිල් මැණිකේ අභිරහස

## කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය - 2025 ජනවාරි
ISBN 978-624-208-761-0

පිනිති වීරසේකර
6 ශ්‍රේණිය
මහ/මාහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

කර්තෘගේ වෙනත් කෘති
අමාශාගේ පොරොන්දුව * ප්‍රථම මුද්‍රණය * 2019 ඔක්තෝම්බර්
පුංචි අපේ සරුංගලය * ප්‍රථම මුද්‍රණය * 2020 දෙසැම්බර්
සුරංගනා සිහිනය * ප්‍රථම මුද්‍රණය * 2020 දෙසැම්බර්
හා පැංචාගේ උදව්ව * ප්‍රථම මුද්‍රණය * 2020 දෙසැම්බර්
දොරටුවෙන් සැඟවුණු අපූරු ගම්මානය * ප්‍රථම මුද්‍රණය * 2023 නොවැම්බර්

## පිදුම

පුංචි අපට හොඳ නරක සහ අකුරු
කියා දෙන විදුහල්පතිතුමියට සහ
පන්ති භාර ගුරුතුමියට
බැති සිතින් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකෝමත් එක කාලෙක මේරියි, නික්ලේෂියි කියලා යාලුවෝ දෙන්නෙක් හිටියා. දවසක් ඒ දෙන්නා  හැංගිමුත්තන් සෙල්ලම කළා.



නික්ලේෂී ගණන් කරනකොට මේරි හැංගෙන්න ගත්තා . මේරි  අටු කාමරයේ තිබුණු අල්මාරියක හැංගෙන්න හිතාගෙන අඩිය තියනකොටම ගල් ගුහාවකට ඇදගෙන වැටුණා. මේරි හොඳටම බය වුණා.




ඊට පස්සේ එයා එතන තිබුණු පොඩි දොරක් දැක්කා. ඒ දොර ඇරගෙන යද්දීම මකුළු දැල්වලින් පිරුණු කාමරයක් තිබුණා.



ඒ කාමරයේ තිබුණු පුංචි කොල කෑල්ලක් මේරි අහුලා ගත්තා. ඒක අරගෙන බලනකොට සිතියමක කොටසක් කියලා දැක්ක මේරී ඒක නික්ලේශිට කියන්න ගියා.





මේරි  ඒක කියන්න යන්න හදනකොට ම නික්ලේශීත් ඒ ගල්ගුහාවටම ඇදගෙන වැටුණා.

මේරී සිතියම ගැන නික්ලේෂිට කීවා. ඊට පස්සේ මේ දෙන්නා එතන තිබුණු පරණ ඉනිමගකින් උඩට නැග්ගා.

මේ දෙන්නා ඊට පස්සෙ දවසෙත් එතැනට ගිහිං  සිතියමේ තවත් කොටස් සොයා ගත්තා.




ඒගොල්ලෝ ඒ සිතියම සම්පූර්ණ වෙනතුරුම කොල කෑලි එකතු කරලා ගළපා බැලුවා. මේක එයාලාගේ ගමේ පරණ සිතියම කියලා එයාලාට දැනගන්න ලැබුණා. සිතියමේ එක තැනක රතු පාට කතිරයක් සලකුණු කරලා තිබුණා.



ඊට පස්සේ මේ දෙන්නා ඒක ගැන එයාලගේ අත්තම්මලාගෙන් අහලා බලනකොට අත්තම්මලා දෙන්නම කිව්වේ කලින් එතෙන තිබුණේ මල්වත්තක් කියලා.



ඒ දෙන්නා ඒක ගැන වැඩි විස්තර හොයද්දී ඒගොල්ලන්ට හමුවුණේ දැන් එතන තියෙන්නේ උද්‍යානයක්. දවසක් ඒ දෙන්නා ඒ උද්‍යානයට ගිහිල්ලා හොඳට සෝදිසි කරලා බැලුවා .




ඒත් එතන කිසිම දෙයක් ඒගොල්ලන්ට හොයාගන්න හම්බවුණේ නෑ. ඒක නිසා මේරි මහන්සියට එතන තිබුණු ගලක් උඩ වාඩිවුණා. මේරි ට එතන පොඩි අමුතු බවක් දැනුනා.



එයා ඒ ගලට තට්ටු කරලා බලද්දි මේරිට ඒ ගලේ බොල් බවක් දැනුණා. මේරි ඒක නික්ලේශිට කිව්වා.

ඒ දෙන්නා ඒ ගල අයින් කරලා බලද්දි එතන කළුවර ගුහාවක් ඇතුලේ පරණ පුංචි පොතක් තිබුණා.

ඒගොල්ලන් ඒක අතට අරගෙන බලද්දි ඒක ඇතුළේ ලස්සනම ලස්සන නිල් මැණිකක් තිබුණා.

එයාලා ඒ ගැන දෙමව්පියන්ට කිව්වා. ඊට පස්සේ කට්ටියම එකතු වෙලා ඒක කෞතුකාගාරයට භාර දුන්නා.





පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්
2025.01.15